**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-----------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ **1.3.1** හා **1.3.2** ඡේදවල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු එකතුව රු. 265,674 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) එකතුව රු. 116,715 ක් වූ ස්ථාවර වත්කම් දෙකක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණනගාස්තු වටිනාකම රු. 110,741 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 7,201,255 ක් වූ ණයගැති හා ණයහිමි ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් සහ කාල විශ්ලේශණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

#### 1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

2015 මැයි 21 දිනැති අංක 15/විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.92,420 ක වියදම් දරා තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.61,925 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු. 770,772 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 832,697 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය පහත දැක්වෙන පරිදි විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කළ මුළු පුනරාවර්තන ආදායම රු. 19,185,414 ක් වූ අතර, ඉන් රු. 18,338,404 ක් රැස් කර තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 95 ක් පමණ විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ රු. 616,203 ක හිඟ ආදායම් වලින් රු.604,203 ක් අය වී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 98 ක් පමණ විය.

### 2.2.2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර වරිපනම් බදු තක්සේරුකර අය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බදු කුලී

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 4 ඡේදයට අනුව, පොදු වෙළඳපොළ කඩ කාමර දෙකක් වෙනුවෙන් අයකළයුතු රු. 400,000 ක එක්වන් මුදල් අයකරගෙන නොතිබුණි.

(ආ) පොදු වෙළඳපළ කඩ කාමරයක මාසික තක්සේරු කුලිය රු. 2,000 ක් වුවද, රු. 800 ක් වූ පැරණි මාසික කුලියම අයකරමින් පැවතුණි.

### 2.2.4 දැන්වීම් පුවරු ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xxx) වගන්තිය ප්‍රකාර එකතුව රු. 45,000ක් වූ දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබිණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 207,509 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 627,500 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

-------------------------

වාර්ෂික අයවැය ලේඛනය මගින් මාර්ග ඉදිකිරීම සඳහා රු.27,275,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු නමුත්, අපේක්ෂිත පරිදි අදාළ ආයතන වලින් අපේක්ෂිත පරිදි ප්‍රාග්ධන ආධාර නොලැබීම නිසා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2016 අප්‍රේල් 07 දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

(ආ) 2012 පෙබරවාරි 06 දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය එදින සිට කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගෙන නොතිබුණි.

(ඇ) සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩම ඇතුළු ඉඩම් 05 ක සහ සුසාන භූමි 14 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

අභයපුර මැද මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ගල් අල්ලා සංවර්ධනය කිරීමේ දෙවැනි අදියරේ අතරුදවුම් මුදල දෙවරක් ගෙවීම නිසා රු.41,013 ක වැඩිපුර ගෙවීම් සිදු වී තිබුණි.

**4. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයෙහි වියදම් විෂයයන් 23 ක් සඳහා වූ එකතුව රු.1,005,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 07 ක එකතුව රු.36,215,251 ක් වූ ඉතිරි කිරීමද, ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් එකතුව රු.36,956,464 ක් වූ ඉලක්කයන්ද නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

**----------------------**

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

**----------------------------------**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය